**අයගම ප්‍රාදේශීය සභාව - 2023**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අයගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අයගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි 02ක ඉදිකිරීම් සඳහා වැය කළ රු.1,520,171ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | එක් ඉදිකිරීමක් 2024 වර්ෂයේ නිවැරදි කරන අතර අනෙක් ඉදිකිරීමට අදාළ භූමිය පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ටේලරයකට සිදුකළ රු.181,075ක පුනරාවර්තන ස්වරූපයේ අලුත්වැඩියා කිරීමක් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |
| (ඇ) | රු.122,180ක පුස්තකාල පොත් වටිනාකම ප්‍රාග්ධන ආදායමක් හා වියදමක් ලෙස සටහන් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ගිණුම් විෂයයන් 03කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.120,542,561ක වෙනසක් විය. | වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කරමි. කර්මාන්ත ණයහිමි ගිණුමේ වෙනස 2015 වර්ෂයට පෙර සිට පැවත එයි. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළයුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.24,780,073ක් වූ වත්කම් විෂයයන් 03ක අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | 2024 වර්ෂයේදී විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කරමි. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,855,682ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,455,454ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,212,380 | 1,566,791 | 1,513,157 | 655,413 | 1,287,560 | 1,263,910 | 1,246,874 | 581,796 |
| කුලී | 8,432,770 | 8,207,927 | 7,607,873 | 1,361,237 | 7,703,612 | 8,423,573 | 8,909,463 | 909,920 |
| බලපත්‍ර ගාස්තු | 790,160 | 651,300 | 559,491 | - | 517,410 | 517,390 | 482,840 | 11,000 |
| වෙනත් ආදායම් | 859,500 | 618,288 | 513,720 | 1,041,179 | 710,000 | 491,840 | 485,576 | 12,593 |
| | 12,294,810 | 11,044,306 | 10,194,241 | 3,057,829 | 10,218,582 | 10,696,713 | 11,124,753 | 1,515,309 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධිමත් තක්සේරුවකින් හා ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2014 හා 2015 වර්ෂවල දී බදු දී තිබුණු කඩකාමර 02ක බදුකරුවන් සමඟ වාර්ෂික ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එමෙන්ම 2023 වර්ෂය සඳහා ත්‍රෛමාසික ගිවිසුම් ඇප සහ හිඟ කුලී රු.135,824ක් ද අයකර නොතිබුණි. | එය සභා තීරණයකි. හිඟ කුලී මාස 06ක් ඇතුළත ගෙවා නිම කිරීමට එකඟ වී ඇත. | හිඟ ආදායම් නොපමාව අයකළ යුතුවේ. |
| (ආ) | කෘෂිබෝග අලෙවි මධ්‍යස්ථානයේ කඩකාමර 02ක් සඳහා 2021 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා රු.99,550ක කුලී අයවිය යුතුව පැවැතිණි. මාස 03ක් කුලී නොගෙවුවහොත් සන්තකය පවරා ගැනීමට හා හිඟ කුලී සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමට වූ කොන්දේසි කිසිවක් ගිවිසුමට ඇතුළත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා දැනුවත් කිරීම් සිදුකර ඇත. | - එම - |
| (ඇ) | වසර 03කට වඩා පැරණි රු.151,993ක අක්කර බදු ශේෂයක් හිඟහිටිව පැවැතිණි. | හිඟ ඒකක ගණන 166 දක්වා අඩු වී ඇත. | හිඟ ආදායම් නොපමාව අයකළ යුතු වේ. |
| (ඈ) | තාවකාලික දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකර නොතිබුණි. | ස්ථිර දැන්වීම් පුවරු 10ක් සඳහා පමණක් සභාවට ගෙවීම් කරනු ලබයි. | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පොදු උපයෝගිතා සේවා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දුම්බර සිට රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයට කෙටිම මාර්ගය වූ දුම්බර තොටුපොළේ ඔරු සේවාව, 2020 වර්ෂයේ සිට අක්‍රීය වී තිබුණද, එය 2023 දෙසැම්බර් 31 දින වනවිටත් සක්‍රීය කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ සිට එම තොටුපොළ පවත්වාගෙන යාමට කටයුතු සලසා ඇත. | ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය පොදු පහසුකම් ලබාදිය යුතු වේ. |

### 3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 4.2ක් පමණ බැහැර කිරීම සඳහා 2023 වර්ෂයේදී කාර්යය මණ්ඩල වැටුප් හා වාහන නඩත්තු වෙනුවෙන් රු.4,676,896ක් වැයකර තිබුණ ද, එම කසළ පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව විවෘත භූමියකට බැහැර කර තිබුණි. | මේ වන විට දිරන කසළ නියමිත පරිදි බැහැර කෙරේ. | ඝන අපද්‍රව්‍ය විධිමත්ව කළමනාකරණය කළ යුතු වේ. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ පැවැති අනවසර ඉදිකිරීම් 43ක් නියමානුකූල කිරීමට හෝ ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා වූ නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. |

### 3.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන පෙර පාසලක දරුවන්ගෙන් 2023 වර්ෂය තුළ අයකරගත් රු.1,776,000ක් සභාව වෙත බැඳීමට කටයුතු නොකර පෙර පාසලේ ගුරුවරියන් අතර බෙදා ගෙන තිබුණි. අනුමත කාර්ය මණ්ඩලය තුළ පෙර පාසැල් ගුරු තනතුරක් අනුමතව නොතිබීම නිසා එම ගාස්තු සභාව වෙත අයකරගෙන ගුරුවරියන් වෙත දීමනා ගෙවීමට නොහැකිව තිබුණු අතර සභා ගොඩනැගිල්ල සඳහා කුලියක් අයකිරීමට ද කටයුතු කර නොතිබුණි. | සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පෙර පාසල් පාලිකා තනතුරක් නොමැති වීම නිසා ඔවුන්ට නිශ්චිත වැටුපක් තීරණය කළ නොහැකි වේ. පෙර පාසල් දරුවකුගෙන් අයකරනු ලබන මුදල ද සභාව තීරණය කර නැත. | පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 01/2021 අනුව කටයුතු කළ යුතු වේ. |

## 3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජල පාරිභෝගිකයින් 512 දෙනෙකු වෙත ජල සැපයුම් ලබා දී 2023 වර්ෂය තුළ එකතු කළ ආදායමට වඩා රු.382,066ක් ඒ වෙනුවෙන් වැය කර තිබුණි. | මුදල් නොමැති වීම වැනි හේතු මත ජලමනු සවිකර නැත. ජල මීටර් සවි කිරීමට අපේක්ෂා කරමි. | ජල මීටර් සවිකර ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු අලුත්වැඩියා කර ධාවනය කළ හැකි මට්ටමේ පැවති ට්‍රැක්ටරයක් හා ටේලරයක් වසර 05ත්-08ත් අතර කාලයක් අභාවිතව පවතී. | ප්‍රතිපාදන ලද විගස ට්‍රැක්ටරය අලුත්වැඩියා කරමි. ටේලරය අපහරණය කිරීමට නිර්දේශ කර ඇත. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |